සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

10 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ඔවුන් **අත්වැල් බැඳගෙන** සිටි කාරණය පිළිබඳ කාගෙත් අවධානයට ලක්වූයේ නැත.
(1) අතිනත පටලාගෙන (2) එකට එක් වී
(3) විනාශයට ළං වී (4) සමූහ වශයෙන් සිටීම

02. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ **වැල නොකැඩී** පාසලට ඇතුළු වූහ.
(1) එකිනෙකා පසුපසින් (2) රංචු වශයෙන්
(3) විටින් විට (4) සේනාවක් සේ

03. මල්ලිකා, මැණිකේ කිවූ වචන අසා **කරබාගෙන** සිටීම මගේ කුතුහලයට හේතු විය.
(1) කර ඔසවාගෙන (2) තරහකින් (3) නිශ්ශබ්දව (4) සිටි ඉරියව්වෙන්

- **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. සාහිත්‍ය නිර්මාණයන් තුළ ..................................... ද සමලංකෘතභාවයක් ද පැවතිය යුතු ය.
(1) ශ්‍රේෂ්ඨත්වයක් (2) ඖචිත්‍යයක් (3) අපූර්වත්වයක් (4) ඖදාර්යයක්

05. බොහෝ ලේඛකයන්ගේ නිර්මාණවල ............................................ වූයේ රට වැසියා තුළ දේශාභිමානය ජනනය කිරීමයි.
(1) අභිමුඛය (2) ප්‍රවේශය (3) ඉෂ්ටාර්ථය (4) මුඛ්‍යාර්ථය

06. ගොවිතැන සමග ........................................... බැඳුණු නිර්මාණය වන්නේ වැව ය.
(1) චිරාගතව (2) සත්‍යයෙන්ම
(3) ඒකාකාරිව (4) අත්‍යන්තයෙන් ම

- **සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදා ඇති පද පේළිය තෝරන්න.**

07. (1) ලේඛනය, පතළ, විශිෂ්ඨ, කනිෂ්ඨ
(2) ශ්‍රේෂ්ඨාධිකරණය, බලධාරි, නිශ්ශබ්දතාව, විද්‍යුත් උපකරණ
(3) දෙපාර්තමේන්තුව, සම්භාෂණය, කෞණ්ඩිය, පරිණතිය
(4) ස්වෙච්ඡා, පිළිරූව්, සංස්කරනය, දොළ

08. යතුර, කවිය, සමීප, භාවාර්ථ යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇලපිල්ල
(2) කෙටි ඇදය, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල
(3) ඇදය, ඉස්පිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල
(4) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල

09. **තද** යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(1) කණ්ඨජය (2) දන්තජය (3) ඕෂ්ඨජය (4) මූර්ධජය

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) ගුත්තිලය, බුත්සරණ, අමාවතුර, පූජාවලිය (2) අනුරාධපුරය, කුරුණෑගල, කොළඹ, හලාවත
   (3) කලියුගය, යුගාන්තය, කළුවර ගෙදර, මීනා (4) කමනි, කමලා, කරුණානායක, කමල්
11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) දරුවන්, මා, අලියෙකු, තා (2) තෝ, දරුවන්, දැරියක, රීතීන්
   (3) ඔවුහු, සාමාජිකයන්, දැරියක, මිනිස්සු (4) අප, ජීවීන්, තොපි, ඔවුන්
12. 'කෙරෙති' යන ක්‍රියා පදය අයත් වන්නේ,
   (1) වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒක වචන ක්‍රියාවකි.
   (2) වර්තමාන කාල ප්‍රථම පුරුෂ කර්මකාරක බහු වචන ක්‍රියා පදයකි.
   (3) අතීත කාල උත්තම පුරුෂ බහුවචන ක්‍රියා පදයකි.
   (4) වර්තමාන කාල කර්මකාරක මධ්‍යම පුරුෂ බහුවචන ක්‍රියා පදයකි.
13. සිංහල අක්ෂර මාලාවේ ඝෝෂාක්ෂර සතරක් වනුයේ,
   (1) ඛ, ඡ, ඨ, ඵ (2) ප, එ, බ, භ (3) ක, ය, ට, ච (4) ය, ර, ල, ව
14. මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නො යෙදුණ වචනය සහිත වරණය තෝරන්න.
   (1) මහප්‍රාණ - ධර්මිෂ්ඨ, අභය, ආකර්ෂණය, භූමිය
   (2) සඤ්ඤක - ළිඳ, පඬිතුමා, සඳවත, ඉජුඃ
   (3) තාලුජ - ප්‍රිය, ශාන්ත, චන්ද්‍රයා, ඡන්න
   (4) අඝෝෂ - කමලා, පණ්ඩිත, ටකරම, මකරන්ද
15. පුද්ගලික යන්නෙහි නාම ප්‍රකෘතිය හා ප්‍රත්‍ය නිවැරදි ව දක්වා ඇති වරණය වනුයේ,
   (1) පෞද්ගල + ඉක (2) පුද්ග + ලික (3) පුද්ගල + ඉක (4) පුද්ගලි + ඉක
16. රසවත් කවි නිර්මාණය කිරීමට <u>සතතාභ්‍යාසය</u> වඩාත් වැදගත් ය. මෙහි අදහස වනුයේ,
   (1) සත්‍යවශයෙන් අභ්‍යාස කිරීම. (2) නිරන්තර අභ්‍යාස කිරීම.
   (3) සත්‍ය ක්‍රියා කිරීම. (4) කවි තේරුම් ගැනීම.
17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් පද පමණක් සහිත වරණය තෝරන්න.
   (1) විධික්‍රියා - එනු, බලන, පනින්න, නැටුවොත්
   (2) නිපාත - මෙන්, සේ, ද, වගේ
   (3) මිශ්‍ර ක්‍රියා - බලත, නටමින්, බලබලා, සිනාසිසී
   (4) විශේෂණ පද - කහ කුරුල්ලා, රණවිරුවා, සුපිරිසිදු, කපටි නරියා
18. පහත වචන අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.
   (1) ගද්‍ය, පද්‍ය, චම්පු, බණ කතා
   (2) උප්පීඩ, උදලු ගොයියා, සේරංගාව, ඇඹුල
   (3) හේන් ගෙවඩීම, අක්වැස්ස, වල් ඇල්ලීම, සකලයන් ඇඹීම
   (4) පොත, පැන්සල, මේසය, සපත්තු
19. දී ඇති ප්‍රාදේශීය ව්‍යවහාරයන් තුළින් නො ගැළපෙන අර්ථයක් ඇති වරණය සොයන්න.
   (1) කොකිස් - පුහුල්, බුන්නා - බීවා, සකලයා - පණුවා, කුඩම්මා - පුංචි අම්මා
   (2) ගහමප - විසිකරපන්, ඔයනවා - ලෙලි ගහනවා, වැටං - වැටවල්, පැයියා - පැව්වා
   (3) නිදියනවා - කුදහප, පුතා දූ - ලේලි, කියන්ඩන් - කියද්දීත්, කවුද්දං - කවුද දන්නෙ
   (4) නිදිකෙරුවා - පුන්නව්වා, නැතුව - නැතුං, ලොකු අම්මා - බක්කම්මා, අම්මණ්ඩි - මව
20. එක් එක් පද පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) සබවස - සත්‍ය වචන, පිටවක - පිටෙහි වකය, බැම - බැම්ම, ග්‍රන්ථය - වෘක්ෂය
   (2) කුලුණින් - කරුණාවෙන්, අකුස්සෙන් - හෙණ්ඩුවෙන්, කේශ - කෙස්, සිංහයා - බාසුරු
   (3) උවම් - උපමා, වැරටිල්ලා - වියළි ගොම, වනය - තුවාලය, අමා - ඇත් පැටවා
   (4) සින්ධු - සාගරය, නරමුල් - පැසුණු කෙස්, අවිනෂ්ට - ඉවත්වීම, ඇළවයා - පිටතට යන්න
21. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) උතුර - දකුණ (2) අබල - දුබල (3) ප්‍රසිද්ධ - සුප්‍රසිද්ධ (4) ආත්ම - භාෂණ

22. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'ෆ' අක්ෂරයට උපධ්මානීය කියනු ලැබේ.
(2) 'මල' යන්න අප්‍රාණවාචී ඒක වචන නාම පදයකි.
(3) මිනිස්සු යන්නෙහි නාම ප්‍රකෘතිය වනුයේ මිනිසා යන්න ය.
(4) රේඵය හා රකාරාංශය එකිනෙකට සමාන නොවේ.

- **23, 24, 25 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

23. පිළිකුලෙන් හෝ නො සැලකිල්ලෙන් සැලකීම.
(1) අබරා සිල් ගත්තා වාගේ. (2) එපා වාහෙට හොඳි බෙදන්නා වාගේ.
(3) ඌරො කවද්ද කහ කැවේ. (4) ආඬි හත්දෙනාගේ කැඳ හැලිය වාගේ.
24. කියනවාට වඩා යමක් ක්‍රියාත්මක කිරීමේ දී වෙනස් වන බව
(1) කටින් බතල කොළ හිටවනවා වගේ. (2) දී කිරට බළල්ලුත් සාක්කිලු.
(3) අබරා සිල් ගත්තා වගේ. (4) කතාව දෝළාවෙන් ගමන පයින්.
25. අරමුණකින් තොරව වැඩ කිරීම.
(1) කළුවා මාරපන් ගියා වගේ. (2) මඬේ හිටවපු ඉන්න වගේ.
(3) අටුවෙන් දූමට පැන්න වගේ. (4) කම්මලේ ඉන්න බල්ල වගේ.
26. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
(1) තේසුවත්‍රා (2) රාවිහය (3) පෙම්ගළිරය (4) දේබැහද්ම
27. A සක්වාලිහිණි - මහගම සේකර
B හදවත පාළුයි - ජයන්ත විමලසේන
C රන් රෝස - පියසේන කහදගමගේ
D මහවැලි වංශය - ජේ. බී. දිසානායක
A B C D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B හා C (2) A, C හා D (3) B, C හා A (4) A, B හා D

- **අංක 28, 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

28. (1) සියලු මිනිස්සු සැමදා සත්‍ය ගරුක විය යුතු ය.
(2) ඕ තොමෝ සභාවෙන් නැගිට ගියා ය.
(3) මිනිස්සු පරිසරය දූෂණය කරන්නේ ඇයි ?
(4) අප ගායකයන් සමග කතාබහ කළෙමු.
29. (1) සියලු නළුනිළියෝ වේදිකාවේ රඟ පා ඇත. (2) සිසුන් තිදෙනෙක් කන්ද තරණය කළහ.
(3) ඔවුහු අනාගත නායකයන් ද? (4) ඔවුහු තුමු සභාව ප්‍රීතිමත් කළහ.
30. (1) අප රෝගීන්ට පිහිට වීම වටී.
(2) මාර්ටින් වික්‍රමසිංහ මහතා තුන් ඇඳතු නවකතා ලියූහ.
(3) අපි නිරන්තරයෙන් සංවිධානාත්මක ව පෙළගැසිය යුතු ය.
(4) ශිෂ්‍යයන් කෝලාහලයට සම්බන්ධ වූහ.
31. * ඔවුහු තැගි බෙදා **දුන්හ.**
* දරුවෙනි, සැමදාම සතුටින් ජීවත් **වන්න.**
* **තෝ** දිනපතා පාඩම් කරන්නෙහි.
* ප්‍රධානියා ලේකම්වරිය ලවා ලියුමක් පිටපත් **කරවයි.**

ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනු අංගවල අනුපිළිවෙළ කුමක් ද?
A මධ්‍යම පුරුෂ ඒක වචන උක්ත පදය
B විධි ක්‍රියා
C ප්‍රයෝජ්‍ය ක්‍රියා
D අතීත කාල බහුවචන ක්‍රියා
(1) C B A D (2) A B C D (3) D B A C (4) C A B D

32. * සමන් හොඳින් පාඩම් කරන .................................. මව පැවසුවා ය.
* රට ජාතිය ආගම ....................................................... වැඩ කළ යුතු ය.
* එම උත්සවය ............................................................ සාමාජිකයෝ සියලු දෙනාම සහභාගි වූහ.
* දෙමව්පියන් ................................................................ ආසන වෙන් කර ඇති බව ගුරුතුමිය කීවා ය.

(1) වෙනුවෙන්, බව, උදෙසා, සඳහා (2) බව, වෙනුවෙන්, සඳහා, උදෙසා
(3) බව, උදෙසා, වෙනුවෙන්, සඳහා (4) සඳහා, උදෙසා, බව, පිණිස

33. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒකි ටවුමෙ තනිවෙලා හිටියා''
(1) ඈය කඬේ ගාව සිටියා ය.
(2) ඇය නගරයේ තනි වී කල්පනා කරමින් සිටියා ය.
(3) ඇය නගරයේ හුදකලා ව ම සිටියා ය.
(4) ඇය නගරයෙන් පිට වී සිටියා ය.

34. පහත කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.

වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
..................................................................................
බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා
හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා

(1) ආකාසේ හඬ තලමින් අකුණු හඬනවා (2) වහිනවා වහිනවා වහිනවා වහිනවා
(3) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා (4) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

35. ''ලක්බිම වන සැරිය'' රචනා කරන ලද්දේ,
(1) එස්. මහින්ද හිමි (2) ඩබ්. ඒ. අබේසිංහ මහතා
(3) මනෝ ප්‍රනාන්දු මහතා (4) මහගම සේකර මහතා

36. අසඩක්, නටාලියා යන චරිත අයත්වන නාට්‍යය කුමක් ද?
(1) තලමල පිපිලා (2) හුණුවටයේ කතාව (3) ජනේලය (4) නරිබෑනා

37. රත්නදීප ජන්ම භූමි
ලංකාදීප විජය භූමි
මේ අපේ උදාර වූ .......
ඉහත ගීතයේ පද රචකයා වනුයේ,
(1) රත්න ශ්‍රී විජේසිංහයන් ය. (2) මහගම සේකරයන් ය.
(3) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් ය. (4) එස්. මහින්ද හිමියන් ය.

38. විරාම ලක්ෂණ වඩාත් නිවැරදි ලෙස යොදා ඇති නිවැරදි වරණය වන්නේ කුමක් ද?
(1) ''බොරලු පොළොවනෙ වහින කාලෙට හොඳට ම බුරුල්. පායන කාලෙට හොඳටම තදයි.''
(2) බොරලු පොළොවනේ.. වහින කාලෙට හොඳට ම බුරුල් පායන කාලෙට හොඳට ම තදයි.
(3) ''බොරලු පොළොවනේ... වහින කාලෙට හොඳට ම බුරුල්. පායන කාලෙට හොඳට ම තදයි''
(4) බොරලු පොළොවනේ... ''වහින කාලෙට හොඳට ම බුරුල්'' පායන කාලෙට හොඳට ම තදයි.

39. පෙරදිග ගොරහැඩි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නෙ
නිදාගන්න පොරව ගත්ත
කළු රෙදි පොට
යන පද්‍ය පාඨයෙන් කියවෙන්නේ,
(1) පුද්ගලයකු ගැන ය. (2) ඉර පිළිබඳව ය. (3) වලාකුළු ගැන ය. (4) උදෑසනක් ගැන ය.

40. ''කවියාගේ වාග් කෝෂය භාවිත ගුණයට මුල් තැන දෙන අතර, විද්‍යා ලේඛකයාගේ වාග් කෝෂය භාව හීනය''
ඉහත ප්‍රකාශයෙහි අදහස වඩාත් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?
(1) භාවයන් ප්‍රබෝධවත් කරන වාග් කෝෂය කවියා යොදාගන්නා අතර විද්‍යා ලේඛකයා භාවයන් ප්‍රකෝපකරන වචන භාවිත කරයි.
(2) කවියාගේ ශබ්ද කෝෂය විද්‍යා ලේඛකයාගේ වාග් කෝෂයට වෙනස් ය.
(3) කවියා භාව ප්‍රබෝධවත් කරන භාෂා භාවිතයට ප්‍රමුඛතාව දෙන අතර, විද්‍යා ලේඛකයා භාව ප්‍රබෝධයෙහි හීන වචන භාවිත කරයි.
(4) විද්‍යා ලේඛකයා භාව හීන වචන භාවිත කළ ද, කවියාගේ වාග් මාලාවට වඩා විශිෂ්ට ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
# Second Term Test - Grade 10 - 2023

10 ශ්‍රේණිය | **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- අංක **(i)** සිට **(x)** දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) අනුස්වාරය සහ විසර්ගය යෙදුන වචන දෙකක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදි ය. එය නිවැරදි කර ලියන්න.
(අ) නෂ්ඨාවශේෂ (ආ) හේසාරාවය

(iii) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාරවල පොදු ව්‍යවහාර ලියන්න.
(අ) කුදහන්නැතුං (ආ) ඉඟුරු

(iv) පහත දැක්වෙන වැකිවල තද කළු අකුරෙන් දක්වා ඇති වචන අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) සාමාජිකයින් **පැමිණියහොත්** අද රැස්වීම පැවැත්වේ.
(ආ) ඔවුහු මා ලවා වැඩ **කරවති.**

(v) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.
(අ) ශාස්ත්‍රය දන්නා බව -
(ආ) දිරා ගිය රෙදි කැබිලි -

(vi) පහත දැක්වෙන වාක්‍යයෙහි උපමා, උපමේය වෙන්කොට දක්වන්න.
''සඳ කැලුම් නිසා සීතාවක සඳ ලොවින් ගෙනා සඳ කඩක් මෙන් රිදී පැහැයෙන් බබළන්නට විය.''

(vii) පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
(අ) ජනාකීර්ණ - (ආ) ආගන්තුක -

(viii) පහත දැක්වෙන අර්ථ දීමට සුදුසු ප්‍රස්තාව පිරුළු ලියන්න.
(අ) පටන්ගත් වැඩය කෙළවර වනතෙක් කළ යුතු ය. -
(ආ) පිළිකුල් දෙය වුවත් එය හිමියාට අගනා දෙයක් වීම. -

(ix) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) සිංහල බෞද්ධයෝ පන්සිල් සුරකිති.
(ආ) නව විදුහල්පතිතුමා ගුරුවරුන් පිළිගත්තේ ය.

(x) පහත වාක්‍ය ඛණ්ඩයේ යෙදී ඇති උපසර්ග පද දෙකක් උපුටා ලියන්න.
''සාමාන්‍ය ඇතුන්ගේ අඩි සලකුණු අතර සුවිශේෂ විසල් අඩි සලකුණු දුටුවහොත් මා අනිවාර්යෙන් ම හඹා යන්නේ ඒ විසල් අඩි සහිත හස්ති රාජයා ය....''

(ල. 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) පැරණි සිංහල ජන සමාජය ආශ්‍රය කරගෙන බිහි වූ ජන කවි මගින් එකල පැවැති ජීවන වෘත්තීන් හා සිරිත් විරිත් ආදී බොහෝ දෑ හඳුනා ගත හැකි ය. ජාතික දායාදයක් වන ජන කවි අපේ ඇගයීමට ලක්විය යුතු ය.

(ආ) වර්තමානයේ දිනපතා අසන්නට ලැබෙන මාර්ග අනතුරු සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතියි. මේ සඳහා රියදුරන් පමණක් නොව මගීන් ද වගකිව යුතු ය. අනෙක් පසින් මාර්ග තදබදය ද වාහන සංඛ්‍යාව වැඩිවීම ද හේතුවකි. මාර්ග අනතුරු අවම කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍යව ඇත.

(ඉ) කාලාන්තරයක් තිස්සේ රටේ පැවති සම්ප්‍රදායික ආනයන ද්‍රව්‍යවලට අමතර ව කුළුබඩු, එළවළු, මල්, පලතුරු ආදී කොට ඇති දේශීය නිෂ්පාදන සමූහයක් දැන් අපනයන වෙළඳපොළට පැමිණ තිබේ. විශාල අරමුදලකින් තොරව නවීන විද්‍යාත්මක ඥානයත්, මිනිස් ශ්‍රමයත් උපයෝගී කර ගනිමින් මෙම අපනයන මාර්ගය වැඩිදියුණු කර ගත හැකි ය. එමගින් විදේශ විනිමය, රැකි රක්ෂා ප්‍රශ්න ආදී ජාතික ගැටලුවට මෙය මහඟු ක්‍රියාමාර්ගයක් වන්නේ ය.

(ඊ) ඒ නාට්‍යය නරඹන අවස්ථාවේ මා තුළ පහළ වූයේ ආස්වාදජනක සිතිවිලි සමුදායකි. මා නාට්‍ය ශාලාවෙන් පිට වූයේ ගොඩනගාගත් අධිෂ්ඨානයක් ද ඇතිවය. පාසල් නාට්‍ය තරගයෙන් මා සම්මාන ලද්දේ ඒ නිසා යැයි සිතමි. නුදුරු අනාගතයේ දී මා මාගේ නව නාට්‍ය ලෝකයට ඇතුළු කරමි. යන සිතිවිල්ලෙන් මම පසුවෙමි. (ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 45 - 50 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

නවකතාකරුවා ජීවිතය වස්තු විෂය කොට ගන්නා බව සැබෑ ය. නමුත් ඔහු ජීවිතය ඇති සැටියෙන් පිළිබිඹු නො කරයි. ඔහු උත්සහ කරන්නේ ජීවිතයේ දී තමා ලැබූ අත්දැකීම කලාත්මක ව ප්‍රකාශ කිරීමට ය.ඔහු ඒ අත්දැකීම් ඉදිරිපත් කිරීම පිණිස කථාවක් ගොතයි. කථාව ගෙතීමේ දී තම කථාවෙන් අදහස් කරන අර්ථය මනාව හෙළි කිරීමට උදව්වන පුවත් පමණක් තෝරාගෙන කථාවේ අර්ථය ඉස්මතුව දැක්වෙන සේ ඒ පුවත් එකට ගැටීමට සලස්වා කථාව ගළපයි. නමුත් නියම නවකතාවක එන චරිත කියවන්නාගේ කුහුල වඩවන ''කථාවට'' වඩා වැදගත් ය. කථාව නවකතාවක සැකිල්ල වශයෙන් සැලකිය හැකිය. එය අවශ්‍යම අංගයක් වුවද චරිත නිරූපණය තරම් වැදගත් නැති බැවිණි. ජීවිතය පිළිබඳ ව භාරදූර අත්දැකීමත්, පෘථුල දෘෂ්ටියත් ප්‍රකාශ කිරීමට තැත් කරන නව කතාකරුවා ඒ කාර්යය ඉටුකරන්නේ නව කතාවේ දැක්වෙන චරිත මගිනි. (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල කවියේ ආරම්භය අනුරාධපුර යුගයේ සිට විද්‍යමාන බව ඉහතින් දැක්විණි. ඉතාම පැරණි යුගයට අයත් යැයි සැලකිය හැකි ශිලාලේඛන රැසක් විද්‍යමාන අතර ඒවාහි අන්තර්ගතය කාව්‍යාත්මක ස්වරූපය ගනී. විශේෂයෙන් ම කුසලානකන්ද, කිරින්ද, කොස්සගම ආදී ස්ථානවල පිහිටා ඇති ශිලාලේඛනවලින් එහි ස්වභාවය කෙබඳුදැ යි හැඳින ගත හැකි ය. මේ අතර හමු වන බොහෝ ශිලාලේඛනයන්හි භාෂාව ක්‍රිස්තු වර්ෂ එකොළොස්වැනි දොළොස්වැනි තෙළෙස්වැනි ශතවර්ෂවල දී කාව්‍ය භාෂාවට සාම්‍යයක් දක්වන බවත් බොහෝ ශිලාලේඛන යහගී විරිතින් ලිය වී ඇති බවත් පෙනේ. එපමණක් ද නොව අට්ඨකථාකරණය පිණිස භාරත දේශයෙන් මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන් සුත්තනිපාතට්ඨකථාවෙහි දක්වා ඇත්තේ මාර්ගයක් සමීපයේ ඇල් ගෙවිලියන් කිහිප දෙනෙකු ගැයූ ජාතිජරාමරණාදිය පිළිබඳ කියැවෙන ගීයක් ඒ අසලින් වැඩම කළ භික්ෂූන් වහන්සේ ශ්‍රවණය කිරීමෙන් අර්හත්භාවයට පත් වූ බවයි. තද්කාරණාව ප්‍රකට කරමින් වීදාගම මෛත්‍රීය හිමියන් ලෝවැඩ සඟරාවෙහි දී කාව්‍යයක් කර ඇත. දීපවංසාදි වංසකථාවලින් ද මුල්කාලීන කාව්‍යයෙහි ස්වරූපය පිළිබඳ යම් අදහසක් ලබා ගත හැකි ය.

(i) ඉතාම පැරණි යුගයට අයත් ශිලාලේඛන හමු වූයේ කුමන ස්ථානවලින් ද?
(ii) සිංහල කවියේ ආරම්භය විද්‍යමාන වන්නේ කුමන යුගයේ සිට ද?
(iii) භාරත දේශයෙන් මෙරටට පැමිණි අටුවාචාරින් කවුරුන් ද?
(iv) බොහෝ ශිලා ලේඛන ලියා ඇත්තේ කුමන විරිතින් ද?
(v) මුල් කාලීන කාව්‍යයේ ස්වරූපය පිළිබඳ යම් අදහසක් ලබාගත හැක්කේ කුමකින් ද? (ල. $2 \times 5 = 10$)

(05) අන්දරවැව ප්‍රදේශයේ වැසියන්ගේ ජීවිතවලට ද, වගා කටයුතුවලට ද වල් අලින්ගෙන් ඇතිවන බාධා දැන් උග්‍ර වී ඇත. එම ව්‍යවසනයට මුහුණ පා සිටින එම ප්‍රදේශයේ අන්දරයාය ගමේ ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් ජානක වික්‍රමරත්න ඔබ යැයි සිතා මේ උවදුර මැඩ පැවැත්වීමට කඩිනම් පියවර ගන්නා ලෙස ඉල්ලමින් අන්දරවැව අඩවි වන නිලධාරි වෙත යවන රාජකාරි ලිපිය ලියන්න. (වචන 100 පමණ සෑහේ)

(ලකුණු 15)

නැතහොත්

සංදීපනි සත්සරණි වන ඔබ ලේකම් ධූරයත්, සඳුන් සේනානායක සභාපති ධූරයත් දරන රුහුණු කවි සමාජයේ නෙළුම්ගම නගර සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන හිටිවන කවි තරගයට සහභාගි වීමට පැමිණෙන ලෙස ආරාධනා කරමින් කවියන් හා ආරාධිත පිරිස වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. තරග පැවැත්වෙන දිනය, වේලාව හා වැඩ සටහන ඔබට අභිමත පරිදි යොදා ගත හැකි ය.

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

10 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය - III

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව''
 (අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරෙකු විසින් ද?
 (ආ) මෙහි නුඹ වහන්සේ යනු කවුරුන් ද?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
 නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
 වහින කලට කුරින් විල්වලින් එත
 (අ) ..........................................................................
 (ආ) ..........................................................................

(iii) (අ) ''village in the Jungle'' කෘතියේ කතුවරයා සඳහන් කරන්න.
 (ආ) ඉහත නව කතාව ලියූ වර්ෂය කුමක් ද?

(iv) කැර මිණි බරණ රැස්
 රසින් සුර සැව් සුවහස්
 සුරන් සහ සහසැස්
 නොකර සිටියේ අහස් කුස හිස්

 (අ) ඉහත පද්‍ය ඇතුළත් පද්‍ය ග්‍රන්ථය ලියවුණ යුගය කුමක් ද?
 (ආ) එහි රචකයා නම් කරන්න.

(v) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට මූලාශ්‍ර කර ගත් ග්‍රන්ථය කුමක් ද?
 (ආ) එම කෘතිය ලිවීමට අනුග්‍රහය දැක් වූ අමාත්‍යවරයා කවුරුන් ද?

(vi) (අ) සුත්තනිපාත අට්ඨ කතාව හෙවත් පරමත්ථ ජෝතිකාව ලියවුණ යුගය කුමක් ද?
 (ආ) ජන ක්‍රීඩා ආශ්‍රයෙන් බිහි වූ ජන කවි වර්ග දෙකක් ලියන්න.

(vii) (අ) බැද්දේගම නව කතාවේ අනුවර්තකයා කවුරුන් ද?
 (ආ) ඔහු පරිවර්තනය කළ කෘති දෙකක් ලියන්න.

(viii) (අ) ගුත්තිල කාව්‍යයට පදනම් වූ ජාතක කතාව කුමක් ද?
 (ආ) ගුත්තිල කාව්‍යයේ පළමු කවිය ලියා ඇත්තේ කුමන කාව්‍ය ගණයෙන් ද?

(ix) ''ඔව්, එයත් මෙහෙ හිටිය, උඹ ළඟ සල්ලි එහෙම තියෙනවා ද ගෑනියෙ ?''
 (අ) මේ කාගේ ප්‍රකාශයක් ද?
 (ආ) මේ ප්‍රකාශය අසා සිටින්නේ කවරෙක් ද?

(x) (අ) බලිතොවිල් හා ශාන්තිකර්මවල යෙදුනු ජනයා දෙවියන් උදෙසා ගායනා කළ කාව්‍ය විශේෂ දෙකක් ලියන්න.
 (ආ) සිංහල ජන කවි තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න. (ල. 2 x 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''රජ්ජුරුවෝ මහ බෝසතාණන් වහන්සේ දැක ලබන ලද අස්වස් ඇති වැ, මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනෙක් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙනෙක් නැතැයි සිතා, ........''

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි සඳහන් අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම කවියෙන් කියවෙන ලෝක ධර්මතාවය කුමක් ද?

(iii) ඝෝෂා සහිත කලබල වීදිවලින් තැතිගෙන සිටි පුංචි මැණිකා ජන ශූන්‍ය නිශ්චල ස්ථානයකට පැමිණීම ගැන ආනන්දිතව එහි ඇන තියා හිඳ ගත්තා ය.

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි සඳහන් පුංචි මැණිකා පැමිණ සිටින නගරය කුමක් ද?

(iv) සුන් එ තතින් එ සඳ
පසු කැර සුරන් වෙණ නද
දියුණු දියුණු ව නද
නික්ම පැතිරෙත දසත විනිවිද

(අ) ඉහත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) මෙම අවස්ථාවෙන් පසුව සිදු වූ දේ කෙටියෙන් ලියන්න.

(v) ''මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා දහස් ගණන් කුඩම්වල රා පුරා තබ්බා අනේක ප්‍රකාර මසවුළු ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස් කොට තබව''යි අමාත්‍යයන්ට විධාන කළහ. එ පවත් පණ්ඩිතයන් වහන්සේට අන්තස්සර පුරුෂයෝ කියා යැවූහ.

(අ) මෙම කොටසෙහි ඇති උපමාව හා උපමේය වෙන වෙන ම ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න. (ල. $4 \times 5 = 20$)

(03) (i) කේවට්ට බමුණා හාස්‍යයට ලක් කිරීමත්

(ii) මහෞෂධ පඬිදුන් වීරත්වයෙන් දැක්වීමත් උම්මග්ග ජාතකයෙන් ඉස්මතු වේ. නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) යහපත් ජීවිතයකට උපදේශ සැපයීමත්

(ii) කාව්‍යාලංකාර භාවිතයත් නිසා උපදේශ කව් රසවත් වී ඇති ආකාරය එක් කරුණකට නියමිත කව්වලින් උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(04) (i) සරල බස් වහරක් භාවිතයත්

(ii) වියත් බස් වහරක් භාවිතයත්

යන කරුණු දෙක අවස්ථෝචිත ලෙස යොදා ගැනීම නිසා ගුත්තිල කාව්‍ය අර්ථවත් වී ඇති ආකාරය නියමිත කව්වලින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(i) ගම වනබත් වීමත්,

(ii) ගම් වැසියන් ක්‍රමයෙන් අභාවයට යාමත් යන කරුණු බැද්දේගම නව කතාවෙන් ඉස්මතු වන ආකාරය නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) වෑත්තෑවේ හිමියන් ප්‍රතිභාපූර්ණ කවියෙකි. නියමිත කව්වලින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10)

(06) නුවණ මෙහෙයවන්නා සියල්ල ජය ගන්නා බව උම්මග්ග ජාතකයෙන් කියවේ. නියමිත කොටසින් උදාහරණ තුනක් ගෙන මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(07) උපදේශ කව්වල ඇති ජනකවි ලක්ෂණ නියමිත කව්වලින් උදාහරණ තුනක් ගෙන විමසන්න. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (1) | 21 - (1) | 31 - (3) |
| 2 - (1) | 12 - (2) | 22 - (3) | 32 - (2) |
| 3 - (3) | 13 - (4) | 23 - (2) | 33 - (3) |
| 4 - (3) | 14 - (1) | 24 - (4) | 34 - (1) |
| 5 - (4) | 15 - (3) | 25 - (1) | 35 - (3) |
| 6 - (4) | 16 - (2) | 26 - (3) | 36 - (2) |
| 7 - (3) | 17 - (2) | 27 - (4) | 37 - (2) |
| 8 - (1) | 18 - (4) | 28 - (2) | 38 - (3) |
| 9 - (2) | 19 - (1) | 29 - (4) | 39 - (4) |
| 10 - (2) | 20 - (2) | 30 - (1) | 40 - (3) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01 (i) සංවාදය, සංඛ්‍යාව, අන්තඃබන්ධය, මනඃකල්පිත

(ii) (අ) නෂ්ටාවශේෂ

(ආ) හේෂාරාවය

(iii) (අ) කුදහන්නැතුං - නිදාගන්නැතිව

(ආ) ඉඟුරු - ඉරිඟු (බඩඉරිඟු)

(iv) (අ) පැමිණියහොත් - අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව

(ආ) කරවති - ප්‍රයෝජ්‍ය ක්‍රියාව

(v) (අ) ශාස්ත්‍රධර

(ආ) වැරහැලි

(vi) උපමාව - සඳ ලොවින් ගෙනා සඳ කඩක් / උපමේය - සීතාවක

(vii) (අ) ජනාකීර්ණ - ජනශූන්‍ය

(ආ) ආගන්තුක - නේවාසික

(viii) (අ) බැදගත්ත බෙරය ගහන්න ඕනෑ

(ආ) උණහපුළුවාගේ පැටිය ඌට මැණිකක්ලු

(ix) (අ) සිංහල බෞද්ධයන් විසින් පන්සිල් සුරකිනු ලබයි / ලැබේ / සුරතෙයි

(ආ) නව විදුහල්පතිතුමා විසින් ගුරුවරු පිළි ගනු ලැබූහ / ලැබුවෝය

(x) සුවිශේෂ, විසල්, සලකුණු (ලකුණු 2 x 10 = 20)

(02) ලකුණු විග්‍රහය

1. සාරවත් භාවය (මාතෘකාව ඇතුළුව) ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම ලකුණු 05 යි. (මුළු ලකුණු 25 යි.)

(03) නවකතාකරු ජීවිතය වස්තුකොට ගත්තත් ජීවිතය ඇති සැටියෙන්ම පිළිබිඹු නො කරයි. ඔහු කලාත්මකව අත්දැකීම් ප්‍රකාශනයට යොදාගන්නා කුහල වඩන කතා පුවත නවකතාවක සැකිල්ල බඳුය. ඊට වඩා වැදගත් වන්නේ චරිත නිරූපණයයි. ජීවිතය පිළිබඳ පෘථුලාවබෝධයත් හාරදූර අත්දැකීමත් හා දැක්මත් පාඨකයාට ලබා දී මේ ලා වැදගත් වන්නේ චරිත නිරූපණයයි. (වචන 45 යි.)

ලකුණු ලබාදීම

1. අන්තර්ගතය - ල. 06
2. වචන ගණන - ල. 02
3. ශිල්පීය දක්ෂතා - ල. 02

මුළු ලකුණු 10

(04) (i) කුසලානකන්ද, කිරින්ද, කොස්සගම

(ii) අනුරාධපුර යුගයේ සිට

(iii) බුද්ධඝෝෂ හිමියන්

(iv) යහගී විරිතින්

(v) දීපවංසාදී වංසකතාවලින් (ල. 5 x 2 = 10)

(05) (අ) රාජකාරි ලිපිය

1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (ලකුණු 15)

**නැතහොත්**

(ආ) ආරාධනා පත්‍රය

1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (ලකුණු 15)

## III කොටස

01. (i) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු　(ආ) තලතා දේවිය / බ්‍රහ්මදත්ත රජුගේ මැණියන්

(ii) (අ) බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත　(ආ) පනින රිළවුන්ට ඉනිමං කමක් නැත

(iii) (අ) ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් / ලෙනාඩ් වුල්ෆ්　(ආ) 1913

(iv) (අ) කෝට්ටේ යුගය　(ආ) වෑත්තෑවේ හිමි

(v) (අ) පාලි ජාතකට්ඨ කතාව　(ආ) වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා

(vi) (අ) අනුරාධපුර යුගය　(ආ) ඔළිඳ කවි / ඔන්චිලි කවි ආදී

(vii) (අ) ඒ. පී. ගුණරත්න මහතා　(ආ) මැකී ගිය දඩමං, සුදු ගෝනා, වානරයා

(viii) (අ) ගුත්තිල ජාතකය　(ආ) වායු ගණයෙන්

(ix) (අ) හිරපල්ලා / බන්ධනාගාර නිලධාරියා　(ආ) පුංචි මැණිකා

(x) (අ) කෝල්මුර කවි / දෙවොල්මඩු / ගම්මඩු කවි　(ආ) සරල බව / අව්‍යාජ බව / සංයමය

02. (i) (අ) සැනසීම ඇතිව, අස්වැසිල්ලෙන් යුතුව
සමත්, හැකි, පුළුවන්

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජු අටළොස් අක්පෞහිණියක් සේනාව සමග පැමින මියුළු නුවර වටලාගත් බව වේදේහ රජු දැනගත් අවස්ථාව

(ii) (අ) රනින් කළ මාළිගය, රනින් කළ විමානය
සැරසුවත්

(ආ) සියලු දෙය අනිත්‍ය බව / නැසෙන බව

(iii) (අ) ජනතාව අඩු, ජනාකීර්ණ නොවන
සතුටට පත් ව

(ආ) තංගල්ල

(iv) (අ) සිඳ දැමූ ඒතනින් එම අවස්ථාවේ දෙවියන්ගේ වීණා නාදය ද පරාජය කරමින් නාදය වැඩි වැඩි වෙමින් දස අතේ විනිවිද පැතිරෙද්දී

(ආ) කෙළෙහි ගුණ නොදන්නා මූසිල අන්දමන්ද වී තමාගේ වීණා තතද සිඳ දැම්මේ ය.

(v) (අ) උපමාව - නඳුන් උයන / උපමේය - මගුල් උයන

(ආ) මඟුල් උයන නඳුන් උයන (ශක්‍ර දෙවියන්ගේ උයන) මෙන් සරසා දහස් ගණන් භාජනවල රා පුරවා තබවා නොයෙක් ආකාර මස් කැවිලි ඒ ඒ තැන්වල වළංවල පුරවා රැස්කොට තබනු යනුවෙන් ඇමතිවරුන්ට අණ කළහ. එම තොරතුරු චර පුරුෂයෝ මහෞෂධ පණ්ඩිතයන්ට කියා යැවූහ.

03. (i) * ''..... කිමෙක්දැයි කට දල්වා උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්චස් පිඩක් හෙළා ....''
* ''..... මුහුණ හා නළල රත් වදමලක් සේ ලේ හා පස් හා වකා....''
* ''..... පවිටු දුෂ්ට අධර්මිෂ්ට .... අඥාන බමුණ මහල්ල''

(ii) * ''..... නුවණ නැත්තව තෝ මාගෙන් වැඳුම් ගන්නට සිතයිදැ'යි බොටුව අල්ලාගෙන දමාලූ සේක.''
* ''.... මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවනට දෙවයි තමන් වහන්සේගේ පුරුෂයන්ට දුන්හ...''
* මහෞෂධ පණ්ඩිතයෝ නම් මම ය. කිසි භයක් නොකරව....''

(වැනි උදාහරණ හෝ වෙනත් ගැලපෙන උදාහරණ ඇසුරින් ලියා ඇති පිළිතුරුවලට ලකුණු දෙන්න.

04. (i) දෙවැනි තුන් වැනි තත...
ගුත්තිල ඇඳුරු සඳ....

(ii) * රුති වන පෙතිනැවිදින් සුමුවෝයා
* දිමුතු යසස් වන් කුසුම සරාගේ
* රූ රැසේ අඳිනා ලෙසේ අත්....

වැනි සුදුසු උදාහරණ සහිත පිළිතුරට ලකුණු දෙන්න.

නැතහොත්

(i) * ආරච්චිගේ ගෙය කැළයට යාම කැලය ගම මැදට කඩා පැනීමක් මෙන් විය.
* මුළු වත්තේත් ගෙයිත් කැලයේත් වෙනසක් නොපෑ ය.

(ii) * ''විසිපස් දෙනෙක් වූ පිරිසෙන් හත් දෙනෙක් ම නැති වූහ...''
* එහි දැන් ළමයි නූපදින්...''

වැනි සුදුසු උදාහරණ සහිත පිළිතුරුවලට ලකුණු පිරිනමන්න.

05. * ''දිය දිය ගොස පළකරමින් සපැමිණි
* ''පටන් සුරිඳු දුන් උපදෙස් සිහිකොට''
* රුරැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී
* පුන් මදාරා මල් දමින් මුදු...

වැනි උදාහරණ තුනක් සහිත පිළිතුරක් සඳහා ලකුණු පිරිනමන්න.

06. * ''...කපස්වීන් ලවා හිමාලයෙන් ගෙන් වූ''
* ''.... බෝධිසත්වයන් වහන්සේ විසින් ඒ ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටුවන ලද පුරුෂයෝ ද...''
* ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත් කරවා....
.... පිටරටින් දනවුවලින් සතර වාසල නියම් ගම්

වැනි සුදුසු උදාහරණ සහිත පිළිතුරුවලට ලකුණු පිරිනමන්න.

07. 1. සරල බව - වරද පෙනෙන තරමට වැරදුණා නොව
2. අව්‍යාජ බව - එක් උන දාට උක් දණ්ඩේ පැණි සේම
3. ජන ජීවිතය හා බැඳුණු නිදසුන් භාවිතය - ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපා

මෙවැනි උදාහරණ සඳහා ලකුණු පිරිනමන්න.